Allianz

# අලියාන්ස් ලයිෆ් ස්මාර්ට් ප්‍රොටෙක්ෂන් - ප්‍රශ්ණ සහ පිළිතුරු

**'ස්මාර්ට් ප්‍රොටෙක්ෂන් ' යනු කුමක්ද ?**

- HUTCH පෙර ගෙවුම් සහ පසු ගෙවුම් පාරිභෝගිකයින් හට අලියාන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් සමාගම වෙතින් ලබාගත හැකි සුවිශේෂී රක්ෂණාවරණයකි.

- මෙම ආවරණය අලියාන්ස් පාරිභෝගික සේවා නියෝජිතයින් මඟින් හෝ 226 අංකනය කර HUTCH දුරකථනය හරහා ලබා ගත හැක

- ආවරණ පැකේජය පහත පරිදි වේ.

| ප්‍රතිලාභ | අගය (රු.) |
|---|---|
| ඕනෑම හේතුවක් නිසා සිදුවන ජීවිත අහිමිවීම් | 100,000 |
| රෝහල්ගත වීමේ ප්‍රතිලාභ (උපරිම දින 20 ක් දක්වා) | 1,000 (දිනකට ) |
| ඩෙංගු මුදල් ප්‍රතිලාභය | 10,000 |

**ආවරණ කාල පරිච්ඡේදය ?**

- මීළඟ මාසයේ පළමු දින සිට පෙර ගෙවුම් සහ පසු ගෙවුම් අනුසන්කරුවන් (Subscribers) සඳහා ආරම්භ වීම සිදුවේ.
- මාසයට අදාළ මුළු වාරිකය අඩුවීම සිදු නොවූයේ නම් ආවරණය, වාරික ගෙවීම් අනුපාතිකය අනුව සිදුවේ.

**වාරික අඩු කරගන්නේ කෙසේද ?**

- ආවරණය සඳහා පාරිභෝගික හවතුන් ලියාපදිංචි වූ වහාම දෛනික වාරිකය ස්වයංක්‍රීයව අඩු වීම සිදුවේ.

**අනුසන් ( Subscribe ) කළ හැකි අය කවුරුන්ද ?**

- තමන්ගේ නමට පවතින ඕනෑම Huch පෙර / පසු ගෙවීම් ජංගම දුරකථන සබඳතාවයක් ඇති වයස 18 ත් 64 ත් අතර වලංගු ජාතික හැඳුනුම්පත් දරණ අයවලුන්.

**අනුසන් ( Subscribe ) කළ එක් අයෙකු සඳහා ලබා ගත හැකි ආවරණ ගණන කොපමණද ?**

- එක් ජාතික හැඳුනුම්පත් අංකයක් සඳහා ලබාගත හැක්කේ එක් ආවරණයක් පමණි. (ආවරණය සඳහා අනුසන් ( Subscribe ) කිරීමේදී ජාතික හැඳුනුම්පත් අංකය අනිවාර්යය වේ )

**පාරිභෝගික භවතුන් හට ආවරණය ක්‍රියා විරහිත කළ හැක්කේ කෙසේද ?**

- **ඔබගේ හච් දුරකතනයෙන් 226 අමතා අලියාන්ස් පාරිභෝගික නිළධාරියෙකු හා සම්බන්ධ වී** ආවරණය ක්‍රියා විරහිත කිරීමට හැකිය.

**දෛනික / මාසික වාරිකය කොපමණද ?**

- ශ්‍රී ලංකා රුපියල් 4.50 + බදු (දෛනික)

**නාමිකයන් නම් කරන්නේ කෙසේද ?**

- මරණ හිමිකම හැරෙන්නට අන් සියලු හිමිකම් අනුසන්කරු වෙත ( Subscribers) ගෙවීම සිදුවේ. මරණ හිමිකම අනුසන්කරුගේ නීත්‍යානුකුල උරුමකරුවන්ට ගෙවනු ඇත.

**වන්දි හිමිකම් ලබා ගන්නේ කෙසේද ?**

වන්දි හිමිකම් ලබා ගැනීම සඳහා පහත සඳහන් පරිදි දැනුම් දිය හැකිය.

- දුරකථන අංක 0112317988 / 89 ඔස්සේ අලියාන්ස් ලයිෆ් ඇමතුම් මධ්‍යස්ථානය ඇමතීම මගින් වන්දි හිමිකම් දැනුම් දිය හැකිය.

**අනුසන්කරු ( Subscriber ) අනතුරක් හේතුවෙන් මියගියහොත් මරණ හිමිකම ගෙවීම සිදු කරන්නේද ?**

- ඔව්.

**රෝහල් වන්දි හිමිකම් මොනවද ?**

- අනුසන්කරු ( Subscriber ) රෝහල් ගත වුවහොත් පැකේජයෙහි සඳහන් පරිදි දෛනික ප්‍රතිලාභ ගෙවීම සිදුවේ. ඔහු හෝ ඇය දැඩි සත්කාර ඒකකය වෙත ඇතුළත් කරන්නේ නම් ප්‍රතිලාභ දෙගුණ වේ.
- දැඩි සත්කාර ඒකකය වෙත නොවන රෝහල් ගත වීම් සඳහා වසරකට දින 20 ක උපරිමයක් දක්වා.
- දැඩි සත්කාර ඒකකය වෙත වන රෝහල් ගත වීම් සඳහා වසරකට දින 10 ක උපරිමයක් දක්වා.
- අඛණ්ඩව පැය 48 ක කාලයක් රෝහල්ගත වී සිටීමෙන් පසු ප්‍රතිලාභ ගෙවීම සිදුවේ.
- ඔප්පුව ආරම්භ කළ දින සිට දින 90 ක පොරොත්තු කාලය අදාළ වේ.

**ඩෙංගු රෝගය උදෙසා වන මූල්‍ය ප්‍රතිලාභයන් සඳහා ඇති කොන්දේසි මොනවාද ?**

- රෝගියා රෝහල් ගත කිරීම අනිවාර්යය වේ. (රජයේ හෝ පුද්ගලික රෝහල්)
- NS1 ප්‍රතිදේහජනනය පරීක්ෂණය තුළින් රෝගී තත්ත්වය තහවුරු වී තිබීම අනිවාර්යය වේ. (වාර්තාව තුළ නම සහ රෝගියාගේ වයස සඳහන්ව තිබිය යුතුය.)

- රෝහල් ගත කර හෝ රෝහල් ගත කිරීමට ප්‍රථමයෙන් පැය 72 ක් ඇතුළත NS1 ප්‍රතිදේහජනනය පරීක්ෂණ වාර්තාව තුළින් රෝගී තත්ත්වය තහවුරු වී තිබිය යුතුය. (රජයේ රෝහලක රෝහල් ගත වීමේදී NS1 වාර්තාව අත්‍යාවශ්‍ය නැත.)
- ඔප්පුව ආරම්භ කළ දින සිට දින 90 ක පොරොත්තු කාලය මේ සඳහා අදාළ වේ.
- පහත දැක්වෙන අගයන්ගෙන් වැඩි අගය සෑම විටම ගෙවනු ඇත.

    - ඩෙංගු රෝගය සඳහා වන වන්දි මුදල (රු 10,000/-)
    - රෝහල් ගත වීමේ ප්‍රතිලාභය ( දිනකට රු 1,000/-) X රෝහල් ගතවී සිටින කාලය. (උපරිම දින 20 ක් දක්වා)

**සාමාජික / සාමාජිකාවකට කොපමණ වාර ගණනක් ඩෙංගු මුදල් ප්‍රතිලාභය ලබා ගත හැකිද ?**

- එක් ඔප්පු වර්ෂයක් සඳහා රක්ෂිතයෙකු හට ඩෙංගු මුදල් ප්‍රතිලාභය එක වරකට වඩා ලබා ගත නොහැක.

**වන්දි හිමිකම් ලබා ගැනීම සඳහා යොමු කළ යුතු ලියකියවිලි මොනවද ?**

- වන්දි හිමිකම් දැනුම් දීම සමග මරණ සහතිකය / රෝග නිශ්චය වාර්තාව ප්‍රමාණවත් වේ
- අදාළ ආවරණයන් සඳහා පහත සඳහන් ලියකියවිලි අවශ්‍ය වේ

➢ මරණ ප්‍රතිලාභය
  - මරණ සහතිකය

➢ රෝහල් ප්‍රතිලාභය
  - රෝග නිශ්චය තුණ්ඩුව / වාර්තාව

➢ ඩෙංගු මූල්‍ය ප්‍රතිලාභය
  - රෝග නිශ්චය තුණ්ඩුව / වාර්තාව
  - NS1 ප්‍රතිදේහජනනය පරීක්ෂණ වාර්තාව

**වන්දි හිමිකම් හෝ වෙනත් ඉල්ලීම් යොමු කරන්නේ නම් ඉදිරිපත් කළ යුතු තොරතුරු මොනවාද ?**

- ජාතික හැඳුනුම්පත් අංකය
- ජංගම දුරකථන අංකය
- වන්දි හිමිකම් ඉල්ලුම් කරන්නාගේ නම
- මරණ වන්දි හිමිකමක් ඉල්ලුම් කරන්නේ නම් මරණයට පත්වූ පුද්ගලයා සමග ඇති ඥාති සම්බන්ධතාවය

**කොන්දේසි හා නියමයන් මොනවාද** ?

www.allianz.lk සහ www.hutch.lk යන වෙබ් අඩවි වෙත පිවිස කොන්දේසි හා නියමයන් පිළිබඳව තොරතුරු ලබා ගත හැකිය.

**පොදු බැහැර කිරීම් මොනවාද ?**

- පෙර පැවති රෝග තත්වයන්
- ආයුර්වේද ප්‍රතිකාර
- අනතුරුදායක ක්‍රීඩාවන් හි නිරත වීම.
- ගුවන් මගියෙකු ලෙස නොව වෙනත් ආකාරයකින් පියාසර කිරීම.
- මත්පැන් සහ මත්ද්‍රව්‍ය භාවිතය.
- උපතේ සිට පැවතෙන රෝගී තත්වයන්.
- වෛද්‍ය ප්‍රතිකාර හා උපදෙස් අනුගමනය නොකිරීම හෝ ලබා නොගැනීම.
- යුද්ධ, ආක්‍රමණයන්, විදෙස් සතුරු කුමන්ත්‍රණ, යුධ අවස්ථාවන් (යුධ ප්‍රකාශ කර තිබීම හෝ නොතිබෙන අවස්ථාවක), ආයුධ සන්නද්ධ හෝ සන්නද්ධ නොවන යුධ විරතිය, සිවිල් යුද්ධ, කැරලි, විරෝධතා, ත්‍රස්තවාදී ක්‍රියා, අභිද්‍රෝහය , හමුදා හෝ බලය පැහැර ගැනීම්, කෝලාහල හෝ සිවිල් කැළඹීම්, වැඩ වර්ජන.
- නාවික, යුධ, ගුවන් හමුදා හෝ එයට සමාන සේවාවන්හි නිරත වීම.
- රක්ෂිතයා යම් සාපරාධී සහ නීති විරෝධී ක්‍රියාවකට යොමු වීම.
- න්‍යෂ්ඨික අපවිත්‍රණය, විකිරනශීලීභාවය, පුපුරණ ද්‍රව්‍ය හෝ න්‍යෂ්ඨික ඉන්ධන හෝ ද්‍රව්‍ය හෝ දේපළ න්‍යෂ්ඨික ඉන්ධන හෝ ද්‍රව්‍ය හෝ එවන් අනතුරක් හෝ එවන් ස්වභාවයක් මගින් සිදුවන අපවිත්‍රණය.
- වැඩි දුර තොරතුරු සඳහා www.allianz.lk සහ www.hutch.lk යන වෙබ් අඩවි වෙත පිවිසෙන්න.

**වන්දි හිමිකම් ගෙවීම සිදු වූවේද යන්න දැනගත හැක්කේ කෙසේද ?**

- අදාළ පාරිභෝගිකගේ බැංකු ගිණුම වෙත වන්දි මුදල් බැර කිරීමෙන් පසු ඒ පිළිබඳව කෙටි පණිවුඩයක් මගින් ඔහු හෝ ඇය දැනුවත් කරනු ඇත.

**පසු ගෙවුම් සහ පෙර ගෙවුම් අනුසන්කරුවන් සඳහා මාසික වාරිකය පෙන්නුම් කරනුයේ කෙසේද ?**

- පසු ගෙවුම් සඳහා - බිල්පතෙහි Allianz Life SMART PROTECTION (අලියාන්ස් ලයිෆ් ස්මාර්ට් ප්‍රොටෙක්ෂන්) යනුවෙන් සඳහන් වන අතර කෙටි පණිවුඩයක් මගින් ඒ පිළිබඳව දැනුම් දෙනු ඇත.

- පෙර ගෙවුම් සඳහා - කෙටි පණිවුඩයක් මගින් දැනුම් දෙනු ඇත.

**සැලකිය යුතුයි**

මෙය අලියාන්ස් ලයිෆ් ස්මාර්ට් ප්‍රොටෙක්ෂන් ඔප්පුව සම්බන්ධයෙන් වන සාරාංශයක් පමණක් වන අතර මෙහි අඩංගු තොරතුරු සම්බන්ධයෙන් අපැහැදිලි තත්ත්වයක් මතු වුවහොත්, මෙයට අදාළ ඉංග්‍රීසි පරිවර්තනය පරිශීලනය කරන්න. නැතහොත්, අලියාන්ස් ලයිෆ් ස්මාර්ට් ප්‍රොටෙක්ෂන් ඔප්පුව ලබා ගැනීම සඳහා www.allianz.lk හෝ www.hutch.lk යන වෙබ් අඩවි වලට පිවිසෙන්න .